සුරාබදු ආඥාපනත
අංක 01/2024 දරන සුරාබදු නිවේදනය

**වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 25 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් 2024 ජනවාරි මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙහි 1 වන උපලේඛනයෙහි දැක්වෙන වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු බලාත්මක විය යුතු බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2017 දෙසැම්බර් 11 දිනැති වූ හා අංක 2049/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක 1004 දරන සුරාබදු නිවේදනය සහ 2018 අප්‍රියෙල් 06 දිනැති වූ හා අංක 2065/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරන ලද අංක 9/2018 දරන සුරාබදු නිවේදනය මෙයින් පරිච්ඡින්න කරමි.

රනිල් වික්‍රමසිංහ
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2024 ජනවාරි 12 වැනි දින
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

## I වන උපලේඛනය

| I වන තීරුව | | II වැනි තීරුව | |
|---|---|---|---|
| බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
| 1. | ස්කාගාර බලපත්‍රය<br>i. ස්කාගාර බලපත්‍රය (තල් අරක්කු හැර)<br>ii. ස්කාගාර බලපත්‍රය (තල් අරක්කු) | <br>25,000,000<br>5,000,000 | <br>5,000,000<br>1,000,000 |
| 2. | රා බෝතල්ගත කිරීමේ බලපත්‍රය | 10,000,000 | 1,000,000 |
| 3. | විනාකිරි නිෂ්පාදනාගාර බලපත්‍රය | 2,500,000 | 500,000 |
| 4. | කිරිපොන්සා හෝ වයින් නිෂ්පාදනය, බෝතල්ගත කිරීම සහ විකිණීම සඳහා දෙන බලපත්‍රය | 100,000 | 25,000 |
| 5. | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබාගන්නා ස්වභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැලෑටි වලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍ය වලින් සෑදූ මධ්‍යසාර 4% පරිමාවට වඩා අඩංගු නොවන මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | 50,000 | 10,000 |
| 6. | ඕනෑම තාල වර්ගයේ ගසකින් ලබාගන්නා ස්වභාවික ද්‍රව්‍ය හෝ වෙනත් පැලෑටි වලින් හෝ ආසවනය කිරීම හැර වෙනත් ක්‍රියාවලියකින් රා හැරෙන්නට ධාන්‍ය වලින් සෑදූ මධ්‍යසාර 4% පරිමාවට වඩා අඩංගු මත්පැන් නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය | 50,000 | 10,000 |
| 7. | සයිඩර් නිෂ්පාදනය සඳහා දෙන බලපත්‍රය | 50,000 | 10,000 |
| 8. | මත්පැන් බෝතල් කිරීමට බලපත්‍රය | 500,000 | 50,000 |
| 9. | ගබඩා සහ ගුදම් බලපත්‍රය | 100,000 | 25,000 |
| 10. | රා එකතු කිරීමේ ස්ථාන බලපත්‍රය | 100,000 | 25,000 |
| 11. | මත්පැන් අපනයනය කිරීම සඳහා වූ බලපත්‍රය | 100,000 | 50,000 |
| 12. | පානීය නොවන ස්ප්‍රීතු ආනයනය සහ ලඟ තබා ගැනීම සඳහා දෙනු ලබන බලපත්‍රය | 100,000 | 25,000 |
| 13. | නිෂ්පාදකයන්ගේ තොග වෙළඳ අරක්කු/ බියර්/ විදේශීය මත්පැන් බෙදා හැරීමේ බලපත්‍රය (අ.නි.6) | 2,500,000 | 500,000 |
| 14. | මත්පැන් සඳහා තොග වෙළඳ බලපත්‍රය (ර.බී.3) | 5,000,000 | 1,000,000 |
| 15. | මත්පැන් සිල්ලරට පිටතට විකිණීමේ බලපත්‍ර (ර.බී.4)<br>I. මහ නගර සභා ප්‍රදේශ සඳහා<br>II. නගර සභා ප්‍රදේශ සඳහා<br>III. අනෙකුත් ප්‍රදේශ සඳහා<br>IV. ඉල්ලුම්කාර ව්‍යාපාරයේ/ සමාගමේ හෝ එහි මව් ව්‍යාපාරයේ/ සමාගමේ වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 1,000 ඉක්මවන වෙළඳ සංකීර්ණ/ වෙළඳසැල් වැනි ආයතන සඳහා ඒවා පිහිටි ප්‍රදේශ නොසලකා දෙනු ලබන මත්පැන් සිල්ලරට විකිණීමේ බලපත්‍රය | <br>15,000,000<br>12,500,000<br>10,000,000<br>15,000,000 | <br>1,000,000<br>1,000,000<br>1,000,000<br>1,000,000 |

| | | | |
|---|---|---|---|
| 16. | හෝටල් බලපත්‍රය (ර.බ.7) සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ සහ සංචාරක මණ්ඩල අනුමැතිය රහිත හෝටල් කාමර 5 හෝ ඊට වැඩි<br>I. කාමර 200 ක් හෝ ඊට වැඩි<br>II. කාමර 20 සිට 199 දක්වා<br>III. කාමර 20 ට අඩු | <br><br><br>1,000,000<br>500,000<br>250,000 | <br><br><br>250,000<br>50,000<br>25,000 |
| 17. | හෝටල් පියීකා බලපත්‍රය (ර.බ.8) | 500,000 | 50,000 |
| 18. | සිනමා සඳහා විනෝද පියීකා බලපත්‍රය (ර.බ.9) | 250,000 | 50,000 |
| 19. | දුම්රිය භෝජනාගාර බලපත්‍රය (ර.බ.10) | 100,000 | 25,000 |
| 20. | භෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලය අනුමැතිය සහිත/අනුමැතිය රහිත) (ර.බ. 11) | 250,000 | 25,000 |
| 21. | තානායම් බලපත්‍රය (ර.බ. 12) | 2,000,000 | 50,000 |
| 22. | හිමිකාර සමාජ ශාලා බලපත්‍රය (ර.බ.13) | 250,000 | 25,000 |
| 23. | සම්භාෂණ හා විනෝද කාර්යයන් සඳහා වන සමාජ ශාලා, ක්‍රීඩා සමාජ හා සාමාජිකයින් සඳහා පමණක් වන සමාජ ශාලා සඳහා වූ බලපත්‍රය (ර.බ. 13ඒ) | 250,000 | 25,000 |
| 24. | අවස්ථා බලපත්‍රය (දිනකට/ එක් පියීකාවකට) (ර.බ. 14) | 100,000 | - |
| 25. | විකුණන වේලාවන් දීර්ඝ කිරීමට අතිරේක බලපත්‍රය (සතියකට) (ර.බ.15) | 100,000 | - |
| 26. | වෙන්දේසිකරුවන් බලපත්‍රය (දිනකට) (ර.බ. 16) | 100,000 | - |
| 27. | පරිපාක ස්ප්‍රීතු/ ඊතයිල් මධ්‍යසාර විකිණීමේ බලපත්‍රය (ර.බ.17) | 300,000 | 100,000 |
| 28. | ඖෂධීය ස්ප්‍රීතු විකිණීමේ බලපත්‍රය (ර.බ.18) | 100,000 | 50,000 |
| 29. | බියර්, ඒල්, ස්ටවුට් හා වයින් විකිණීම සඳහා වූ විශේෂ බලපත්‍රය (සංචාරක මණ්ඩල අනුමැතිය සහිත/ අනුමැතිය රහිත)<br>i. සිල්ලරට පිටතට විකිණීම සඳහා (ර.බ.22ඒ)<br>ii. ස්ථානීය පරිභෝජනය සඳහා (ර.බ.22බී) | <br><br><br>250,000<br>250,000 | <br><br><br>25,000<br>25,000 |
| 30. | රටබීම බලපත්‍ර සමග නිකුත් කරනු ලබන අරක්කු විකිණීමේ බලපත්‍ර<br>I. සුරාබද්ද අ.(ර.බී.) 1 බලපත්‍රය (AFL 1)<br>II. සුරාබද්ද අ.(ර.බී.) 2 බලපත්‍රය (AFL 2)<br>III. සුරාබද්ද අ.(ර.බී.) 3 බලපත්‍රය (AFL 3)<br>IV. සුරාබද්ද අ.(ර.බී.) 4 බලපත්‍රය (AFL 4) | <br><br>250,000<br>250,000<br>250,000<br>250,000 | <br><br>50,000<br>50,000<br>50,000<br>50,000 |
| 31. | බෝතල් රා විකිණීම සඳහා වූ බලපත්‍රය | 200,000 | 100,000 |
| 32. | වතු ආපනශාලා බලපත්‍රය | 100,000 | 25,000 |
| 33. | වයින් ස්ප්‍රීතු විකිණීම සඳහා වූ බලපත්‍රය | 50,000 | 10,000 |

| බලපත්‍රයේ ස්වභාවය හෝ විස්තරය | | බලපත්‍ර ගාස්තුව රුපියල් | ඇපය රුපියල් |
|---|---|---|---|
| 34. | තොග වශයෙන් පදම්කල අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | එක් බලපත්‍රයකට රු. 25,000,000 /- ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වන දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12 ක කාල පරිච්ඡේදය තුළ සුරාබදු බලපත්‍ර ස්ථානයේ අරක්කු විකිණීම/ නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාල පරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කල අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 2/- බැගින් | එක් සුරාබදු බලපත්‍රයක් සඳහා රු. 1,000,000/- බැගින් |
| 35. | තොග වශයෙන් ඉක්ෂුපාක අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | | |
| 36. | තොග වශයෙන් විශේෂ අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | | |
| 37. | තොග වශයෙන් පොල් අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | එක් බලපත්‍රයකට රු. 5,000,000/- ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වන දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12 ක කාල පරිච්ඡේදය තුළ සුරාබදු බලපත්‍ර ස්ථානයේ අරක්කු විකිණීම/ නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාල පරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කල අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 2/- බැගින් | |
| 38. | තොග වශයෙන් තල් අරක්කු නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ නිෂ්පාදනය සහ තොග වෙළඳසලවලට නිකුත් කිරීම සඳහා වන සුරාබදු බලපත්‍රය | රු. 1,000,000/- ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වන දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12 ක කාල පරිච්ඡේදය තුළ | එක් සුරාබදු බලපත්‍රයක් සඳහා රු. 500,000/- බැගින් |

| | | | |
|---|---|---|---|
| | | සුරාබදු බලපත්‍ර ස්ථානයේ තල් අරක්කු විකිණීම/ නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාල පරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කල තල් අරක්කු විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 2/- බැගින් | |
| 39. | තොග වශයෙන් මෙරට සෑදූ විදේශ මත්පැන් නිෂ්පාදනය සහ/හෝ විකිණීම සඳහා සහ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | රු. 10,000,000/- ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වන දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12 ක කාල පරිච්ඡේදය තුළ සුරාබදු බලපත්‍ර ස්ථානයේ විදේශ මත්පැන් විකිණීම/ නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාල පරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කල විදේශ මත්පැන් විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 2/- බැගින් | එක් සුරාබදු බලපත්‍රයක් සඳහා රු. 1,000,000/- බැගින් |
| 40. | තොග වශයෙන් ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සහ විකිණීම සඳහා සහ/හෝ නිෂ්පාදනය සහ තොග වෙළඳසැල්වලට නිකුත් කිරීම සඳහා දෙන බලපත්‍රය | රු. 25,000,000/- ක අවමයකට යටත්ව දැනට පවත්නා වර්ෂයේ අගෝස්තු 31 වන දිනට අවසන් වන පිළිවෙලට යෙදුණු මාස 12 ක කාල පරිච්ඡේදය තුළ සුරාබදු බලපත්‍ර ස්ථානයේ ධාන්‍ය මත්පැන් විකිණීම/ නිකුත් කිරීම පදනම මත ගණනය කොට සුරාබදු බලපත්‍රයේ කාල පරිච්ඡේදය තුළ ස්ථානයේ ඇස්තමේන්තු කල ධාන්‍ය මත්පැන් විකිණීම හෝ නිකුත් කිරීම තොග ලීටරයකට රුපියල් 2/- බැගින් | එක් සුරාබදු බලපත්‍රයක් සඳහා රු. 1,000,000/- බැගින් |